# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,801 — 1961 දෙසැම්බර් 9 වැනි සෙනසුරාද — 9.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 64/61 (9).

**1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 2 වෙනි නියෝගයෙන් අග්‍රාණ්ඩුකාරවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඔහු විසින් කරනු ලැබූ ආඥාව.

ඔ. ඊ. ගුණතිලක,
අග්‍රාණ්ඩුකාරවරයා.

1961 දෙසැම්බර් 9,
කොළඹ.

### ආඥාව

1. මේ ආඥාව 1961 අත්‍යවශ්‍ය සේවා ආඥාව නමින් හැඳින්විය හැකි ය.

2. 1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 2 වෙනි නියෝගයෙහි "අත්‍යවශ්‍ය සේවය" යන පදය විස්තර කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් සේවාවන් මහජන ප්‍රයෝජනය සඳහා බව හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(1) ආහාර හෝ පාන කොටස් සැපයීම, ආරක්ෂා කිරීම හා බෙදා හැරීම.

(2) ඛනිජ තෙල් නිෂ්පාදන හා ගෑස් ඇතුළු ඉන්ධන සැපයීම හෝ බෙදා හැරීම.

(3) විදුලි බලය සැපයීම.

(4) මගීන් හෝ බඩු සඳහා මහාමාර්ග ගමනා ගමන සේවාවන්.

(5) වතුර සැපයීම.

(6) තැපැල්, ටැලිෆෝන්, විදුලි පණිවුඩ හා ගුවන් විදුලි සේවාවන්.

(7) පහත සඳහන් කරුණු සඳහා කළ යුතු යයි අවශ්‍ය හෝ නියමිත කුමන අන්දමේ විස්තරයක වුව ද සියලු සේවා කාර්ය හෝ වැඩ—

(අ) තීරු බදු ආඥාපනතෙහි (235 වෙනි අධිකාරය) කාර්යයන් සඳහා විස්තර කරනු ලැබූ පරිදි යම් වරායක් ඇතුලත හෝ යාත්‍රාවකින් ආහාර හෝ පාන වර්ගයක් හෝ රට අඟුරු, තෙල් හෝ ඉන්ධන, බෑම, ගෙනයාම, ගොඩ බෑම, ගබඩා කිරීම, බාර දීම හා ඉවත් කිරීම ;

(ආ) තේ, රබර් හෝ පොල් හෝ ඒවායේ නිෂ්පාදන, වගා කිරීම, තැනීම, නිපදවීම, විකිණීම, නැව්වලට පැටවීම හා නැව්වලට පැටවීම සඳහා ගබඩා කිරීම ;

(ඇ) රජය විසින් හෝ වෙනත් අන්දමකින් පවත්වා ගෙන යනු ලබන ආරෝග්‍යශාලාවල, සාත්තු නිවාසවල, ඖෂධ ශාලාවල හා වෙනත් සමාන ආයතනවල ලෙඩුන්, නඩත්තු කිරීම, බාර ගැනීම, පෝෂණය කිරීම හා ලෙඩුන්ට සාත්තු කිරීම හා ප්‍රතිකාර කිරීම ;

(ඇ) (අසූචි ඉවත් කිරීම හා ගෙනයාම ඇතුළුව) කසළ කාණු ක්‍රමය, කසළ ශෝධනය හා කුණු ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය බල මණ්ඩල මගින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ;

(ඉ) මංමාවත්, පාලම්, බෝක්කු, අහස් යාත්‍රාංගන, වරායවල් හා දුම්රිය මාර්ග ඇතුළු මංමාවත්, දුම්රිය මාර්ග හෝ ගුවන් ගමනාගමන සේවාවන් සඳහා පහසුකම් සැපයීම හා පවත්වාගෙන යාම.

(8) රජයේ යම් දෙපාර්තමේන්තුවක් හෝ එහි යම් අංශයක් විසින් සපයනු ලබන සේවාවන්.

(9) සමූපකාර තොග වෙළඳ ආයතනය, ලංකා ගමනාගමන මණ්ඩලය හා වරාය සංයුක්ත මණ්ඩලය විසින් සපයනු ලබන සේවාවන්.

(10) ලංකා මහ බැංකුව, ලංකා බැංකුව හා වෙළෙඳ හෝ මුදල් ව්‍යාපාරික කටයුතුවල යෙදුණු අන්කිසි බැංකුවක් විසින් සපයනු ලබන සේවාවන්.

(11) කිනම් විස්තරයක් වුවද භාණ්ඩ, ගෙන්වීමේ, පිටරට යැවීමේ, විකිණීමේ, සැපයීමේ හෝ බෙද හැරීමේ යෙදුනු යම් වෙළෙඳ හෝ වාණිජ ව්‍යාපාරයක් විසින් සපයනු ලබන සේවාවන්.

3. මේ ආඥාව ලංකාද්වීපය මුළුල්ලේම අදළ විය යුතු ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.